(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 10(1).]

# පාර්ලිමේන්තුවේ අංක 10 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 ජනවාරි මස 27 වැනි සඳුදා**

## 2014 පෙබරවාරි මස 05 වැනි බදාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 08 දිනැති අංක 1770/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),— 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 නොවැම්බර් 08 දිනැති අංක 1783/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ නියෝග (අංක 3),— 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 පෙබරවාරි 15 දිනැති අංක 1797/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)ඊ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 නොවැම්බර් 22 දිනැති අංක 1837/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2014 පෙබරවාරි මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1946/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) දැනට වර්ෂයක පමණ කාලයක සිට, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන පිහිටා ඇති සුදු කොහු කර්මාන්ත ශාලාව වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ විශාල ජනතාවකට රැකියා අහිමිව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

(ii) එම සුදු කොහු කර්මාන්ත ශාලාව ආශ්‍රිත මධ්‍යස්ථානය මගින් රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමු කිරීමේ අරමුණින් පුහුණු පාඨමාලාවක් ද පවත්වාගෙන ගිය බවත්;

(iii) නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන පවා හිමි කරගත් එම ආයතනය වසා දැමීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, නැවතත් මෙම කර්මාන්ත ශාලාව ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2465/'12

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අයත් ක්‍රිකට් ක්‍රීඩාංගණ සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම වියදම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම ප්‍රාග්ධන සහ පොලී සංරචක අනුව කොපමණද;

(iii) අ (i) හි සඳහන් ක්‍රිකට් ක්‍රීඩාංගණවලින් ලබාගත් ආදායම එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3061/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ, මතුගම සහ කළුතර යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල් රැසක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මුදල් නොමැතිකමින් නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාප තුළ ඇති අඩක් නිම කරන ලද ගොඩනැගිලි සහිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජය විසින් වෙන් කරන ලද මුදල්වලට සිදුවූයේ කුමක්ද;

(iii) එම පාසල්වල පවතින අඩක් නිම කළ ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය වන මුදල කොපමණද;

(iv) අදාළ මුදල් ප්‍රතිපාදන කඩිනමින් වෙන් කොට එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කර දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3143/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) හතලිස් තුන් ලක්ෂයක් පමණ වන පාසල් සිසුන් අතරින් උසස් අධ්‍යාපනය සඳහා වරම් ලබන ප්‍රතිශතය කොපමණද;

(ii) ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව එම ප්‍රතිශතය අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iii) අධ්‍යාපනය වෙනුවෙන් 2012 වර්ෂය හැර පසුගිය වර්ෂ විස්සක කාලය තුළ යෙදවූ මුදල ඒ ඒ වර්ෂවල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 වර්ෂය තුළ අධ්‍යාපනය වෙනුවෙන් රජය වෙන්කළ මුදල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන්ගෙන් මුදල් එකතු කිරීම මේ වනවිට සාමාන්‍යයෙන් පවතින ක්‍රියාවලියක් බවත්;

(ii) එයට හේතුව රජය අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් නොකිරීම බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3347/'12

ගරු පී. හැරිසන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබා දී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබා ගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබා ගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබා ගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන් කර හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3618/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සංචාරක ව්‍යාපාරයට සහ සංස්කෘතික වශයෙන් වැදගත්කමක් උසුලන "සීගිරිය" පුරාවිද්‍යා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු භාර වී තිබෙන ආයතනය කවරේද;

(ii) සීගිරියට ප්‍රවිෂ්ට වන බොරලු මාර්ගය ප්‍රතිසංස්කරණය සහ සීගිරිය අවට පවතින සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම බොරලු මාර්ගයේ ප්‍රතිසංස්කරණය සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iv) සීගිරිය නගර සංවර්ධනයට පියවර ගෙන තිබේ නම්, එය සිදු කරනු ලබන ආයතනය කවරේද;

(v) සීගිරිය පුරාවිද්‍යා භූමිය ආශ්‍රිතව උපයනු ලබන ආදායම් හිමි වන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3695/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකා බැංකුව මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් ලංකා බැංකුව විසින් වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයකු පත්වූ විට ඊට අදාළව ලංකා බැංකුවට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3912/'13

ගරු රුවන් රණතුංග මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය සේවයෙන් නීත්‍යානුකූලව ඉවත් වූ වෛද්‍යවරුන් නැවත රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීමේදී සේවා පළපුරුද්ද, ශ්‍රේණිය හා ජ්‍යෙෂ්ඨත්වය නොසලකා ඔවුන් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය තනතුරේ පිහිටුවාලීමේ අසාධාරණ ක්‍රමවේදයක් පවතින බවත්;

(ii) හමුදා සේවයෙන් ඉවත්ව තවදුරටත් රටට සේවය කිරීමට කැමති බොහෝමයක් වෛද්‍යවරුන්ගේ රට හැර යෑමට එම තත්ත්වය හේතුවී ඇති බවත්;

(iii) එවැනි තත්ත්වයක් යටතේ වුවද, රජයේ වෛද්‍ය සේවයට ඇතුළත් වූ වෛද්‍ය එම්. ඩී. ඩබ්ලිව්. ලොකුගේ ඇතුළු වෛද්‍යවරුන් ගණනාවක් මේ වන විට බලවත් අසාධාරණයකට ලක් වෙමින් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රේණිය පහත හෙළා එම වෛද්‍යවරුන් රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීම හමුදා සේවය යටතේ ඔවුන් රටට කළ සේවය වරදක් සේ සලකා කරනු ලබන දඬුවම් දීමක් නොවන්නේද;

(ii) යුද්ධය පැවති අවධියේ ඔවුන් ස්ව කැමැත්තෙන් ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය බලකායට එක් වී සිදු කළ සේවය ඇගයීමට ලක් නොකිරීමට හේතු කවරේද;

(iii) එම වෛද්‍යවරුන් බඳවා ගැනීමේදී ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 17 වැනි වගන්තිය යටතේ දැක්වෙන අනු වගන්තීන් හා 14.4 සහ VII වැනි පරිච්ඡේදයේ 9.3 හා 9.4 වගන්තීන්ට අනුවත් දිය හැකි අනුග්‍රහ ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3939/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට එක් කොටසක හෝ හිමිකම ඇති, විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම ඇතුළු කටයුතු සඳහා ස්ථාපනය කළ සියලු සමාගම්වල නම් කවරේද;

(ii) එම එක් එක් සමාගමේ කොටස් බෙදී යන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කොටස්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඉහතින් සඳහන් කළ එක් එක් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතරින් ලංකා විදුලිබල මණ්ඩලයට පත් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4173/'13

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතනයක්ද;

(ii) නොඑසේ නම්, එය අමාත්‍යාංශ වගකීමක් රහිත ස්වාධීන ආයතනයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ,

(i) ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා කවුරුන්ද;

(ii) මුදල් මණ්ඩලයේ කාර්යභාරය කවරේද;

(iii) කළමනාකරණ හා පරිපාලන තීරණවල අවසන් බලධරයා කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවට සේවකයින් බඳවා ගැනීමට අදාළව අනුමත පරිපාටියක් හා වැටුප් ව්‍යුහයක් තිබේද;

(ii) එසේ නම්, එය අනුමත කර ඇති බලධාරියා කවුරුන්ද;

(iii) ඒ සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිශෝධනය කරන ආකාරය සහ ඒ සඳහා යොදා ගන්නා නිර්නායකයන් කවරේද;

(ii) ඉහත (ඇ)(i)හි සඳහන් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය හා වැටුප් ව්‍යුහය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4252/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අංක 509/7 හා 1988.06.07 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව යටතේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගනු ලබන නිලධාරීන් පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එම සේවා ව්‍යවස්ථාවේ ඒ බව සඳහන් වගන්තිය කවරේද;

(iii) එවැනි වගන්තියක් නොවේ නම්, ඉහත කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු බවට සඳහන් කොන්දේසිය පත්වීම් ලිපිවල ඇතුළත් කිරීම සඳහා එකී සේවා ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තිය යටතේ ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iv) සේවා ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් නොවන්නේ නම් හා 28 වැනි වගන්තිය අනුව ක්‍රියාමාර්ග නොගත්තේ නම්, ඉහත පරිදි බඳවා ගත් නිලධාරීන්ගේ පත්වීම් ලිපිවලට (අ)(iii)හි සඳහන් කොන්දේසිය ඇතුළත් කළ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අදාළ පත්වීම් ලිපිවල එම සේවා ව්‍යවස්ථාවට අනනුකූල පරිදි කොන්දේසි ඇතුළත් කිරීම නිසා අසීරුවට පත්ව ඇති නිලධාරීන්ට සහනයක් සලසන්නේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1965/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි, මලාමුර ඇළ හරහා පාලමක් ඉදිකිරීම සඳහා මුල්ගල් තබා වර්ෂ කිහිපයක් ගතවී ඇතත්, මෙතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) ප්‍රදේශයේ ජනතාවගේ ගමන් පහසුව සඳහා මෙම පාලම කඩිනමින් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මලාමුර ඇළ හරහා පාලම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2469/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ දක්වා පවත්වා ඇති "දැයට කිරුළ" ප්‍රදර්ශණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රදර්ශණය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම එක් එක් ප්‍රදර්ශණය සඳහා වැය කළ මුදල කවරේද;

(iv) අනාගතයේදී පැවැත්වීමට සැලසුම් කර ඇති දැයට කිරුළ ප්‍රදර්ශණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශණය පැවැත්වූ දිනය කවරේද;

(ii) එය පැවැත්වූ ස්ථානය සහ එකී ප්‍රදර්ශණ භූමිය සඳහා පවරාගත් ඉඩම් ප්‍රමාණය කවරේද;

(iii) එම ප්‍රදර්ශනය සඳහා වූ සමස්ත පිරිවැය සහ එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ මුදල සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) එම භූමියේ දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන භාණ්ඩ හෝ ගොඩනැගිලි කවරේද;

(vi) එම ප්‍රදර්ශනය සඳහා ගනු ලැබූ ඉහත සඳහන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ වියදම සාධාරණීකරණය කළ හැකිවන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3431/'13

ගරු පී. හැරිසන් මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මෙතෙක් හඳුනාගෙන ඇති ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකාවට ආවේනික ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iii) එයින් මේ වන විට වඳ වී ඇති ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iv) වඳවී ඇති එම ශාක විශේෂවල නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ශ්‍රී ලංකාවේ ශාක විශේෂ වඳවීමට හා වඳවීමේ තර්ජනයට ලක්වීමට බලපාන හේතු කවරේද;

(vi) වඳවීමේ තර්ජනයට ලක් වී ඇති ශාක ආරක්ෂා කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාව තුළ පැල සිටුවීමේ වැඩසටහන යටතේ සිටුවා ඇති පැල සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ සිටුවා ඇති පැල වර්ග කවරේද;

(iii) එම පැල ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) වඳවී ඇති හා වඳවීමේ තර්ජනයට ලක් වී ඇති පැල වර්ග ඉහත වැඩසටහන යටතේ සිටුවා තිබේද;

(v) එම පැල සිටුවීමේ වැඩසටහන වෙනුවෙන් පසුගිය වර්ෂ 5 තුළ දී වාර්ෂිකව වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3903/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟ ආශ්‍රිතව වැලි ගොඩ දැමීමට අවසරය ලබා දිය හැකි සමුපකාර සමිති පිහිටුවීමට අවසර ලබා දී තිබේද;

(ii) මහවැලි ගඟෙන් ගොඩ දමනු ලබන වැලි ප්‍රවාහනයේ දී යම් ගාස්තුවක් අය කරන්නේද;

(iii) එසේ නම්, එම ගාස්තු අය කරනු ලබන පාර්ශ්වයන් කවුරුන්ද;

(iv) වැලි ගොඩ දැමීමේ බලපත්‍රයක් ලබා දීමට අය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 පෙබරවාරි මස 19 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2451/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ තුන්වැනි අදියර ක්‍රියාත්මක කිරීම මගින් දැනට අනාරක්ෂිත ප්‍රදේශයේ ඇති විශාල බිම් ප්‍රමාණයක් සංවර්ධනය කළ හැකි බව පිළිගන්නේද;

(ii) එම අදියර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර තිබේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට වෙන්කර තිබේද;

(iv) එලෙස වෙන් කරන ලද මුදල කොපමණද;

(v) ඒ සඳහා ප්‍රතිපාදන සපයන රට හෝ ආයතනය කවරේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2681/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති නොතකා සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම පෞද්ගලීකරණය කිරීමට හෝ එහි කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට පැවරීමට හේතුව කවරේද;

(ii) එහි නව හිමිකරුවන්ගේ හෝ කළමනාකරණ හවුල්කරුවන්ගේ නම් සහ අදාළ ගිවිසුම කවරේද;

(iii) එහි කළමනාකරණ ගිණුම් ඉදිරිපත් කරන ලද දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඒවා ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගමට අයත් ඉඩම් විදේශිකයින්ට විකිණීමට හේතු කවරේද;

(ii) එම ඉඩම්වල විකුණුම් මිල කොපමණද;

(iii) ඉහත කී ගනුදෙනුවට අදාළ 100% බද්ද ගෙවා තිබේද;

(iv) එසේ නම්, එය ගෙවන ලද දිනය කවරේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ඉඩම් ගනුදෙනුව සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලද්දේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් උපදේශක කමිටුවේ හෝ තේරීම් කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) නොඑසේ නම්, එය සිදු කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3348/’12

ගරු පී. හැරිසන් මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබා ගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබා ගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන් කර හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3469/’13

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදු කරන ලද රටවල නම් කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා වැය වූ මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් සංචාරයේදී ජනාධිපතිතුමා සමග සංචාරයට එක් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම එක් එක් සංචාරයේදී කරන ලද සාකච්ඡා සහ අත්සන් කරන ලද ගිවිසුම් කවරේද;

(vi) එම එක් එක් සංචාරය, සාකච්ඡාව හා ගිවිසුම මගින් රටට අත්වූ හෝ අත් වෙමින් ඇති හෝ අත් වෙතැයි අපේක්ෂිත ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3928/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ නගරය සුන්දර කිරීම හා සංවර්ධනය කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ අරමුණක් යැයි ප්‍රකාශ වන නමුදු, කොළඹ 15, මෝදර, ඉබ්බගෙවත්ත නමින් හැඳින්වෙන ස්ථානය තවමත් ඉතා අපිරිසිදුව තිබෙන බවත්;

(ii) එම ස්ථානයේ ඇති මුළුමනින්ම ජරාජීර්ණ වූ පොදු වැසිකිළි පද්ධතිය අවට පරිසරයට දුර්ගන්ධය පතුරන ස්ථානයක් බවට පත්වී ඇති බවත්;

(iii) දිරාපත් වූ වැසිකිළිවලින් ගලා යන විෂබීජ සහිත ජලය හේතුවෙන් ප්‍රදේශවාසීන් දැඩි ලෙස සෞඛ්‍ය ප්‍රශ්නවලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රදේශය තුළ මිනිස් වාසයට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමටත්;

(ii) දිරා ගිය වැසිකිළි වෙනුවට නවීන වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3943/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ පත්කොට ඇති ජනාධිපති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිෂන් සභා කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් කොමිෂන් සභාව,

(i) සැදුම්ලත් සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ සුදුසුකම් කවරේද;

(ii) පත් කිරීමේ අරමුණු කවරේද;

(iii) තම වාර්තා ඉදිරිපත් කර තිබේද;

(iv) එම වාර්තා සභාගත කරන්නේද;

(v) එම වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මකකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4075/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී සහ 2013 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා සිදු වූ මාර්ග අනතුරු අතරින් රථ වාහන පොලීසියට වාර්තා වී ඇති අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරුවලින් සිදුවූ මරණ සංඛ්‍යාව හා ආබාධිතවූවන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාර්ග අනතුරුවලට වැඩි වශයෙන් භාජනය වන වාහන වර්ග කවරේද;

(iv) මෙම අනතුරු අවම කිරීම සඳහා රථවාහන පොලීසිය සහ ප්‍රවාහන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග අනතුරු සිදුකිරීමට වරදකරුවී රියදුරු බලපත්‍රය තහනම් කිරීමේ දඬුවමට යටත්වූ අයෙකුට වංචනික ලෙස වෙනත් තොරතුරු ඉදිරිපත් කර නව රියැදුරු බලපත්‍රයක් ලබාගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එවන් අය හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4139/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ගය (පනාවල පාර) සහ ඇහැලියගොඩ - කිරිඇල්ල මාර්ගය (නැදුරන පාර) පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4250/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේදී ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් කින්නියාවේ වෙරළාසන්නව ජීවත් වූ ජනතාව නඩුවුට්ටු ගම්මානයේ යළි පදිංචි කරන ලද බවත්;

(ii) නැවත පදිංචිකර වර්ෂ අටක් පමණ ගතවී ඇතත්, එම ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් ලබා දී නොමැති බවත්;

(iii) නැවත පදිංචි කළ දින සිට මේ දක්වා පානීය ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් එම ජනතාව අතිමහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මාර්ග පද්ධතිය, පානීය ජල පහසුකම්, ප්‍රවාහනය වැනි මූලික පහසුකම් ලබාදෙන බවට බලධාරීන් විවිධ අවස්ථාවලදී පොරොන්දු ලබා දී ඇතත්, ඒ සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බැවින්, නැවත පදිංචි කරන ලද එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපයා ගැනීමට අදාළ ප්‍රශ්න විසඳාලීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4331/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1956 වර්ෂයේදී බැංකු සේවකයින්ට ප්‍රදානය කරන ලද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ, 1972 දී සමගි පෙරමුණ රජය විසින් අහෝසි කර නැවත 1977 දී යළි ස්ථාපිත කරනු ලැබ 1996 දී යළිත් වරක් පොදු පෙරමුණ රජය විසින්ම අහෝසි කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1996 ජනවාරි 01 දිනට පසු බඳවාගත් රාජ්‍ය බැංකු සේවකයින්ට 2009 ජනවාරි 01 දින සිට විශ්‍රාම වැටුප් හිමිකම ලබාදෙන බවට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා කර ඇති ප්‍රකාශය පරිදි එම සේවකයින්ට එකී ප්‍රතිලාභය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඉහත පරිදි විශ්‍රාම ප්‍රතිලාභ ලබාදී නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ඒ ඒ රාජ්‍ය බැංකුවලට දැරිය හැකි විශ්‍රාම ක්‍රමයක් ස්ථාපිත කිරීමට 2011.05.19 දින ලිඛිතව උපදෙස් ලබා දී තිබේද;

(ii) බැංකු නිලධාරීන් විසින් එම නියෝගය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iii) ලංකා බැංකුවේ කළමනාකාරීත්වයේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර භාණ්ඩාගාර ලේකම්වරයාට යොමු කරන ලද 2012.05.23 දිනැති විශ්‍රාම වැටුප් යෝජනාව මෙතෙක් අනුමත නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මීට වර්ෂ හතරකට පමණ පෙර මුල්ගල් තබා ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලද මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අතරමග නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන සපයන ලද ආයතනය කුමක්ද;

(iii) ප්‍රතිපාදන සපයා තිබේ නම්, ඉදි කිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(iv) එහි ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබා ගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගණනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීළඟ දැයට කිරුළ ප්‍රදර්ශනය තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2895/'12

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයන් විසින් ප්‍රකාශ කොට ඇති ආකාරයට 2002 - 2003 වර්ෂයේදී පැවැති එක්සත් ජාතික පක්ෂ රජය විසින් ලබාදී තිබූ බදු නිදහස් කිරීම්වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් බිලියන 1000ක් තරම් විශාල වන්නේද;

(ii) නොඑසේ නම්, එහි නිවැරදි වටිනාකම කොපමණද;

(iii) ඉහත සඳහන් බදු නිදහස 2004 - 2005 කාල සීමාව තුළදී ඉවත් කරන ලද්දේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක්සත් ජාතික පක්ෂ රජය විසින් ලබා දී තිබුණු බදු නිදහස වැරදි සහගත සහ නීතිවිරෝධී බවට 2004 රජය විසින් ඔප්පු කොට තිබුණේද;

(ii) එම බදු නිදහස ඉවත්කිරීමෙන් අනතුරුව රැස්කර ගනු ලැබූ බදුවල වටිනාකම මේ දක්වා වාර්ෂික පදනමින් කොපමණද;

(iii) එවන් අඩු වටිනාකමක් සහිත බදු ප්‍රමාණයක් රැස්කර ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එක්සත් ජාතික පක්ෂ රජය විසින් හඳුන්වා දුන් බදු නිදහස් කිරීම් ඉතා අසුභවාදී ලෙස විවේචනයට ලක් කළ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය 2004 වර්ෂයෙන් පසුව එවන් බදු නිදහස් කිරීම් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය විසින් ලබා දී ඇති බදු නිදහස් කිරීම්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3292/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂයේදී මාධ්‍යවේදීන්ට සිදුවන හිරිහැර පිළිබඳ සොයා බැලීමට ඇමති අනුකමිටුව පිහිටුවීම දක්වා කාලය තුළ මාධ්‍යවේදීන්ට සිදු වූ හිරිහැර පිළිබඳ ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ඇමති අනුකම්පාව පිහිටුවීමෙන් පසු මේ දක්වා පැහැර ගැනීමට සහ පහර දීමට ලක් වී ඇති මාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ක්‍රියා සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
## (2014 පෙබරවාරි මස 19 වැනි බදාදා)

2905/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දිනයේ සිට අද දක්වා ශ්‍රී ලංකාව පාලනය කර ඇති රජයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් කරන ලද එක් එක් රජයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1985, 1995, 2005 සහ 2012 යන වර්ෂයන්වලදී එක් අමාත්‍යවරයෙකු වෙනුවෙන් දරන ලද සාමාන්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා පනත මගින් පළාත් සභාවන්හි අමාත්‍යවරු සංඛ්‍යාව සීමාකර ඇති ආකාරයට, කැබිනට් අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව නීතියෙන් සීමා නොකිරීමට හේතුව කවරේද;

(ii) කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් රටට යහපතක් වී තිබේද; එසේ නැතහොත්, එමගින් රටට වැඩි බරක් පැටවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3736/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පේරාදෙණිය, ක්‍රිස්ටෝපර් පාර, අංක 124 ඩී දරන ස්ථානයේ පදිංචි, එච්. එල්. ප්‍රේමචන්ද්‍ර මහතා (සේවා අංක 1060814) ලංකා බැංකුවේ කඳපොල ශාඛාවේ විධායක නිලධාරි තනතුරේ සේවයේ නියුතුව සිටියදී, යම් චෝදනාවක් මත 2000.04.18 දින සේවය අත්හිටුවා, චෝදනාවන් ඔප්පු කිරීමට අපොහොසත්වීමේ හේතුව මත 2001.05.14 දින සිට නැවත සේවයේ පිහිටුවා සිටින අයෙකු බවත්;

(ii) 2010.03.09 දින සිට 2010.05.16 දින දක්වා ඔහු රාජකාරි නිවාඩු මත නිදහස් කරනු ලැබ සිට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ලංකා බැංකුව, පේරාදෙණිය ශාඛාවේ දැනට කණිෂ්ඨ විධායක නිලධාරී ධූරය දරන ප්‍රේමචන්ද්‍ර මහතාට 2000 වර්ෂයට පෙර පැවැති විධායක නිලධාරී සේවා තත්ත්වය සැලකිල්ලට ගනිමින් හිඟ වැටුප් ඇතුළු අනෙකුත් සේවක අයිතීන් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2439/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී වගා කිරීමට හෝ වෙනත් බෝග වර්ග වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2713/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 මාර්තු මස ජිනීවාහි පැවති මානව හිමිකම් කවුන්සිලයට ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ඒමට පෙර, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයා සමග නිල වශයෙන් පළමු හමුවීම පැවැත්වුණු දිනය කවරේද;

(ii) එකී හමුවීමෙහි දී සාකච්ඡාවට ලක්වූ කරුණු කවරේද;

(iii) ඉහත හමුවීමෙන් අනතුරුව, ඇමරිකා එක්සත් ජනපදය විසින්ද ඉහත දැක්වූ ආකාරයේ යෝජනාවක් ගෙන එන්නට ඉඩ තිබෙන බව අපේක්ෂා කරනු ලැබුවේද;

(iv) ශ්‍රී ලාංකීය දෘෂ්ටිකෝණයෙන් ගත් කල ඉහත කී යෝජනාව පරාජයවීමට නොසැලකිලිමත්භාවය, උද්දච්චභාවය සහ අදක්ෂතාව හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජිනීවාහිදී සම්මතවූ යෝජනාව සම්බන්ධයෙන් අද වනවිට ප්‍රතිකර්ම වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) පැවති ස්ථාවරයට පටහැනිව යමින් 2012 මැයි මස 18 වැනි දිනදී ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් මහත්මිය හමුවීමට රජය කැමැත්ත පළ කළේ මන්ද;

(iii) එහිදී සාකච්ඡා කළ කරුණු සහ එකී හමුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස දැන් ක්‍රියාත්මක වන කටයුතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/'12

ගරු පී. හැරිසන් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබා ගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3624/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව මගින් හල්දුම්මුල්ල, බෝගහපිටිය, සොරගුණේ වනාන්තරය ආශ්‍රිතව එළිපෙහෙළි කරමින් මාර්ගයක් ඉදිකරන බවත්;

(ii) ඊට අදාළව සිදු වන වනාන්තර විනාශය පිළිබඳව වේලි ඔය ගොවි සංවිධානය සහ භික්ෂු සංවිධානය මගින් ජනාධිපතිතුමාට ලිඛිතව දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය ඉදි කිරීමේ අරමුණ කවරේද;

(ii) එම මාර්ගය ඉදි කිරීම සඳහා පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3698/'13

ගරු අනුර දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 වර්ෂයේදී විදුලි බිලට ඉන්ධන ගැලපුම් ගාස්තුවක් ඇතුළත් කර අය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ඉන්ධන ගැලපුම් ගාස්තුව පනවන ලද දිනය කවරේද;

(iii) එම ඉන්ධන ගැලපුම් ගාස්තුව අයකිරීමට හේතු කවරේද;

(iv) එම ඉන්ධන ගැලපුම් ගාස්තුව අය කරන ලද දිනයේ සිට එක් එක් මාසය වෙනුවෙන් විදුලිබල මණ්ඩලය ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉන්ධන ගැලපුම් ගාස්තුව තවමත් අය කරන්නේද;

(vi) නොඑසේ නම්, එය අය කිරීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3931/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පීවී ඔයිල්" නමැති සිංගප්පූරු සමාගම සමග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පාලන අධිකාරිය විසින් 2011.10.07 දින සහ 2012.01.25 දින යන අවස්ථා දෙකකදීම අත්සන් කළ දූෂිත ගිවිසුම නැවත අලුත් කිරීමට සූදානම් වන බවත්;

(ii) මාස හයක කාල සීමාවකට පෙට්‍රල් මෙට්‍රික් ටොන් දෙලක්ෂ හතලිස් දාහක් ආනයනය කිරීම සඳහා එම සමාගම සමග අත්සන් කළ ගිවිසුමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් කෝටි 116 ක් පාඩු වූ බවත්;

(iii) 2013 වර්ෂයේදී එම ගිවිසුම නැවත අත්සන් කිරීමට තීරණය කර ඇති බවට වෘත්තීය සමිති චෝදනා නගන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත දූෂණ හේතුවෙන් දිනෙන් දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලබන බවත්;

(ii) එම පාඩු පියවා ගැනීම සඳහා වරින් වර ඉන්ධන මිල ඉහළ දමන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4001/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය වත්ත (හොරේකන්ද කොටස) නමින් ඉඩමක් තිබේද;

(ii) එම ඉඩමේ කොටසක් වන කැබලි අංක 9 හි පිහිටි අක්කර 9, රූඩ් 3, පර්චස් 29.85ක විශාලත්වයෙන් යුතු කලුගලේ තක්සේරු වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී කලුගල පානදුර නල්ලුරුවේ පදිංචි ආචාර්ය තිරාන්ද සිල්වා නැමැති අයෙකුට බදු පදනම මත ලබා දීමට තීරණය කර තිබේද;

(ii) එම තීරණයට එළැඹී දිනය කවරේද;

(iii) එකී තීරණයට පදනම් වූ හේතු කවරේද;

(iv) එම කලුගල බදු දීමට අදාළ වාර්ෂික බදු මුදල කොපමණද;

(v) එකී බදු මුදල තීරණය කරන ලද පදනම කවරේද;

(vi) ඉහත කී බදු දීමට අදාළව ගිවිසුම් අත්සන් කරනු ලැබූ දිනය කවරේද;

(vii) එකී බදු ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බදුදීම පිළිබඳ කටයුතුවල දී විනිවිදභාවය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4076/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා නියමිත විශ්‍රාම ගන්නා වයස් සීමාව කවරේද;

(ii) මෙම වයස් සීමාව ඉක්මවා යම් නිලධාරියකු රාජ්‍ය සේවයේ යොදවා ගැනීමේ දී අනුගමනය කරන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට බඳවා ගැනීමේ දී ඔවුන් බඳවා ගන්නා තනතුරු නාම කවරේද;

(ii) ඔවුන්ට ලබා දෙන වැටුප් සහ වාහන, ඉන්ධන හා දුරකථන වැනි වෙනත් පහසුකම් කවරේද;

(iii) එම එක් එක් අයිතමයේ ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත සඳහන් බඳවා ගැනීම් සහ අදාළ පහසුකම් ලබා දීම ඊට අදාළව පවතින චක්‍රලේඛ උපදෙස් අනුවම සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාම ගත යුතු වයස ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින අමාත්‍යාංශ ලේකම්වරු නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවය කරන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කවරේද;

(iii) විශ්‍රාම ගත යුතු වයස් සීමාව ඉක්මවා දැනට සේවය කරන අමාත්‍යාංශ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, වයස හා සේවය කරන අමාත්‍යාංශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4215/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල දී ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා ආහාරපාන සපයන ලද ලියාපදිංචි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු වූ මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එයින් මේ වන විට ගෙවා අවසන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම වර්ෂ තුන සඳහා ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය, ඒ ඒ වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මුදල් නොගෙවීම හේතුවෙන් අදාළ සැපයුම් සිදුකිරීම දුෂ්කර බව අදාළ සැපයුම්කරුවන් විසින් දන්වා ඇති බව දන්නේද;

(ii) එම හිඟ මුදල් ගෙවා අවසන් කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iii) හිඟ මුදල් ගෙවා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4251/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුවිල් ප්‍රධාන වීදිය හා මැද වීදිය සම්බන්ධ කරන ජුම්මා මහ පල්ලිය වීදිය ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් එකී මාර්ගය ගමනාගමනයට නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

(ii) එම මාර්ගය අබලන් වී තිබීම හේතුවෙන් එය භාවිතා කරන ජනතාව බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට වහාම පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2460/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිල්වලා ගංගාවේ, මාතර, මහානාම පාලමේ සිට මුහුද දක්වා කොටස ගැඹුරු කිරීමේ සැලසුමක් පවතින්නේද;

(ii) එසේ නම්, එම සැලසුම මගින් ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) ඊට අවශ්‍ය අරමුදල් සපයා ගනු ලබන්නේ දේශීය අරමුදල්වලින් ද; නැතහොත්, විදේශීය අරමුදල්වලින් ද;

(v) විදේශ ප්‍රතිපාදන ලබා ගන්නේ නම්, එම රටවල් හෝ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2714/'12

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මේ වන විට මෙරට තිබෙන ජාතික රෝහල් සංඛ්‍යාව සහ පෞද්ගලික රෝහල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) එම රෝහල්වල,

(i) රෝගීන් සඳහා ඇති මුළු ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඳන් සංඛ්‍යාව සහ වෛද්‍යවරු සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iii) එම ඇඳන් සංඛ්‍යාව සහ හෙද-හෙදියන් සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iv) රෝගීන් සංඛ්‍යාවට, හෙද-හෙදියන් සංඛ්‍යාවට, වෛද්‍යවරුන් සංඛ්‍යාවේ අනුපාතය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3363/'12

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;
(iii) එම ආයතනවල රජයේ වාහන ලබා දී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;
(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;
(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;
(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;
(iv) කුලී පදනම මත ලබා ගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබා ගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන් කර හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද;
(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;
(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;
(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3904/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මින්නේරිය, ගිරිතලේ ජාතික වනෝද්‍යානයේ නැගෙනහිර මායිමේ අක්කර පහක පමණ භූමි ප්‍රමාණයක ඉදිකර ඇති ගොඩනැගිල්ල කුමක්ද;
(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ කවරේද;
(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳව ලිඛිත අවසරය සහිත ලියවිල්ල ඉදිරිපත් කරන්නේද;
(iv) එම අවසරය ලබා දුන් පාර්ශ්වය කවුරුන්ද;
(v) එසේ අවසරයක් ලබා ගෙන නොමැති නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2896/'12

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට "ප්‍රිවි කවුන්සිලයක්" (පෙරවි මඩුල්ලක්) ක්‍රියාත්මක වන්නේද;
(ii) එවන් "ප්‍රිවි කවුන්සිලයක්" කිසි කලෙක හෝ ක්‍රියාත්මකව තිබුනේද;
(iii) එසේ නම්, එය ක්‍රියාත්මකව තිබූ කාල සීමාව කවරේද;
(iv) ප්‍රිවි කවුන්සිලය හෝ ඊට සමාන වූ ක්‍රමවේදයන් අහෝසි කොට දමා ඇති බැවින් අද වන විට අධිකරණ පද්ධතිය තුළ අභියාචනා ක්‍රියාවලියක් සඳහා පවත්නා යාන්ත්‍රණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිදහසින් පසු මේ දක්වා ක්‍රියාත්මක කොට ඇති අතීතයට බලපාන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි නීති කවරේද;

(ii) ඒවා පනවනු ලැබූ හා ක්‍රියාත්මක කරනු ලැබූ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අතීතයට බලපාන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි නීති සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොකරන බවට පිළිගැනීමක් තිබේද;

(iv) නොඑසේ නම්, 2003 - 2004 වර්ෂවල බදු නිදහස් කිරීමේ නීතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2014 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා)

2303/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළ ඩෙංගු වැළඳීම, රිය අනතුරු, සියදිවි නසා ගැනීම, ආහාර විෂවීම, කායික හෝ මානසික අතවරයන්ට ලක්වීම යන හේතු මත රෝහල්ගත කළ / මිය ගිය පාසල් ළමුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂය තුළ විවිධ වරදවල් යටතේ චෝදනා ලබා ළමා අධිකරණයට යොමු කර ඇති පාසල් සිසුන් සංඛ්‍යාව, ඔවුන් අයත්වන වයස් කාණ්ඩය හා පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2787/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද; නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිලය නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව "ජෙනරාල්" යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාගවීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට හෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ හටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබා දීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව,

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදු වූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත්වීම් නොසලකා හැරියේ කවුරුන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3013/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හ/තංගල්ල පිරිමි ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු 2007 අප්‍රේල් මස 4 වැනි දින තංගල්ල බස් නැවතුම්පොළේ සිට ඔහුගේ නිවසට රැගෙන යන අතරමඟදී තංගල්ල එවකට හිටපු නගරාධිපතිවරයා විසින් බලවත් ලෙස අපයෝජනයට ලක්කර ඇති බවත්;

(ii) ඒ පිළිබඳව තංගල්ල පිරිමි ජාතික පාසලේ ශිෂ්‍ය උපදේශක ගුරු මහතාට දැන්වීමෙන් පසු තංගල්ල පොලිසියට පැමිණිලි කර ඇති බවත්;

(iii) එම පැමිණිල්ල ඉහත පොලිස් ස්ථානයේ පැමිණිලි අංක C.W.I.B 127 පිටුව 24 වැනි ඡේදයෙහි සටහන් කර ඇති බවත්;

(iv) එම පැමිණිල්ල අනුව එම නගරාධිපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන මෙන් තංගල්ල නගරයේ විශ්‍රාමික පුරවැසි සංගමය ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3267/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයෙන් කොළඹ මහ නගර සභාවට අයවිය යුතු සමස්ත හිඟ වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2012 වර්ෂය වෙනුවෙන් එම මහ නගර සභාවට අයවිය යුතුව තිබූ සමස්ත වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3367/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ ලියාපදිංචි ආරක්ෂක රැකවරණ ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකුගේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2013 වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැඳවුම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකු වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම මුදල ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3654/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල්, නවෝදා පාසල් හා ප්‍රාථමික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා එක් එක් විෂයය අනුව ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පාසල්වල ගුරු හිඟයක් තිබේද;

(iv) එසේ නම්, ගුරු හිඟයක් ඇති පාසල්වල නම් සහ ගුරු හිඟය පවතින විෂයයන් කවරේද;

(v) එම ප්‍රදේශයේ ගුරු හිඟයක් පවතී නම්, එය විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අම්පාර දිස්ත්‍රික්කයේ ඉහත (අ) (i) හි සඳහන් පාසල් අතරින් පුස්තකාල පහසුකම්, ජල පහසුකම් හා සනීපාරක්ෂක (වැසිකිලි) පහසුකම් නොමැති පාසල් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3686/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට් රාජ්‍යයේ රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් 300කට වැඩි පිරිසක් එහිදී ඔවුන්ට මුහුණ පෑමට සිදු වී ඇති විවිධ තාඩන, පීඩන සහ අතවර හේතුවෙන් සේවා ස්ථානවලින් පැනයාම නිසා වෙනත් කිසිදු චෝදනාවක් නොමැතිව පොලිස් අත්අඩංගුවේ සහ සිර කඳවුරුවල රඳවාගෙන සිටින බවත්;

(ii) එලෙස කරදර හිරිහැරවලට ලක්ව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් සොයා බලා ක්‍රියා කිරීම සඳහා කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුයුක්ත කර ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගෙන් එම ගැටලු විසඳීම සඳහා ක්‍රමවත්, කඩිනම් ප්‍රතිචාරයන් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දැනට ක්වේට් රාජ්‍යයේ කඳවුරුවල රඳවා සිටින පිරිස් කඩිනමින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/'13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මඟින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3932/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් කොලොන්නාව තෙල් නිමාවෙන් (CPSTL) 2/3 ක කොටසක් ඉන්දියන් තෙල් සමාගමට ලබා දී තිබේද;

(ii) කොලොන්නාවේ පිහිටි තෙල් සංස්ථාව අවටින් පවරාගත් අක්කර 80ක ඉඩම ඉන්දියන් තෙල් සමාගමට නොමිලේ ලබා දීමට සාකච්ඡා පවත්වනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4182/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාතකඩ සහ දෙල්ගොඩ යන ගම්මානවල පිහිටා ඇති මහා පරිමාණ ගල්කොරි හේතුවෙන් සිදුවී ඇති පරිසර දූෂණය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) එකී පරිසර දූෂණය වැලැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර සහ ඉදිරියේ දී ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2819/'12

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව වෙත ගුවන් ගමන් සේවා සපයන ගුවන් සේවා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් සේවාවන්හි නම් කවරේද;

(iii) ඒවා ස්ථිර ගුවන් සේවාවන්ද; නොඑසේ නම්, කුලී පදනමින් වන ගුවන් යානා සේවාවන්ද;

(iv) එම ගුවන් සේවාවන්ට හයවැනි පියාසර නිදහස (sixth freedom of traffic) එනම් වෙනත් රටවල් දෙකක් අතර සේවා සැපයීම අතරතුරදී තම රටේද නතර වී යළි පියාසර කිරීමේ අයිතිය පවතීද;

(v) මෙම සියලුම ගුවන් සේවාවන් මගින් මසකට ප්‍රවාහනය කළ හැකි මුළු මගීන් සංඛ්‍යාව කොපමණද;

(vi) පසුගිය වර්ෂයේදී මෙරටට පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(vii) සංචාරක පැමිණීම් සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙම ගුවන් සේවාවන් උපකාරී වන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3081/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට සංශෝධන ගෙන ඒමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එම කටයුතු ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iii) ඒ සඳහා ඇති බාධක ඉවත් කර සංශෝධන ගෙන ඒම සඳහා කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ අටක කාල සීමාව තුළ දුම්පානය කිරීම නිසා මිය ගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්පානය නිසා පිළිකා හෝ වෙනත් රෝග හේතුවෙන් රෝගී වන පුද්ගලයෙකු සඳහා රජයට වැය කිරීමට සිදුවන මුදල කොපමණද;

(iii) දුම්බීම නිසා රෝගී වන පුද්ගලයන් සඳහා 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල සීමාව තුළ වෙන් කිරීමට සිදුවූ රෝහල් ඇඳන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2012 රාජ්‍ය අයවැය මගින් සෞඛ්‍ය සඳහා වෙන් කරනු ලැබූ මුදලින් දුම්පානය හේතුවෙන් පිළිකා හෝ වෙනත් රෝගවලට ගොදුරුවූ රෝගීන් වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදලේ ප්‍රතිශතය කොපමණද;

(ii) එම මුදල පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3378/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු මැද පළාත තුළ වත්මන් පාසල් ළමුන් සංඛ්‍යාව සහ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපන කටයුතු සඳහා එම පළාත් සභාව මගින් පසුගිය වර්ෂ පහක කාලය තුළදී වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඒ අනුව පසුගිය වර්ෂ පහ තුළ එම පළාතේ එක් පාසල් දරුවෙකු වෙනුවෙන් වාර්ෂිකව වැය කරන ලද මුදල කොපමණද;

(iv) පසුගිය වර්ෂ පහ තුළ එක් ළමයෙකු වෙනුවෙන් වැය කරන ලද සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කවල නව පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම ඉදි කරන ලද හා අලුත්වැඩියා කරන ලද පාසල්වල නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ඉදි කරන ලද හා අලුත්වැඩියා කරන ලද පාසල්වල 2012 වර්ෂය අවසාන වන විට අධ්‍යාපනය ලැබූ ළමුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3731/'13

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පිළියන්දල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අත්සනින් 2012.02.20 දින වැවල, ආනන්ද සමරකෝන් විදුහලේ විදුහල්පති වෙත යවන ලද ලිපියක් මගින්,

(i) එම විදුහලේ 5 වසර සමත්වන දරුවන් මාම්පෙ ධර්මරාජ විදුහලට ඇතුළත් කිරීමට වහාම කටයුතු කරන ලෙසත්;

(ii) මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ වැවල ආනන්ද සමරකෝන් විද්‍යාලයේ සංවර්ධනය වෙනුවෙන් විශාල මුදලක් රජය වැයකර ඇති බවත්;

දන්වා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවල ආනන්ද සමරකෝන් විදුහලේ සංවර්ධනය සඳහා යොදවා ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් යොදවා ඇති කාර්යයන් කවරේද;

(iii) එම මුදල් කවුරුන් විසින්, කුමන වැඩසටහන යටතේ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3905/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියාවේ ඉදිකර ඇති "කුඩන්කුලම්" න්‍යෂ්ටික බලාගාරය ආශ්‍රිත ප්‍රදේශයන්ට සිදුවන පාරිසරික බලපෑම් වලට අදාළව යම් නිර්දේශ ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත නිර්දේශය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම බලාගාරයෙන් පිටවන කිරණ මගින් ජීවීන්ට හානිකර තත්ත්වයක් ඇති විය හැකිද;

(iv) මෙම ව්‍යාපෘතියට අදාළව, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින කොන්දේසි හෝ ගිවිසුම් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද;

3933/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව මේ වන විට රුපියල් බිලියන 95ක් ඉක්මවා ඇති බව දන්නේද;

(ii) එම සංස්ථාව විසින් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ බැංකු අයිරා වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 43කට අධික මුදලක් ගෙවීමට තිබේද;

(iii) මේ වන විට රාජ්‍ය බැංකු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iv) එම තත්ත්වය යටතේ ඉහළ ණය පොලී කොන්දේසි මත විදේශීය තෙල් සමාගම්වලින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මාර්තු මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2946/'12

ගරු රවි කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී,

(i) අයවැයෙන් උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) උසස් අධ්‍යාපනය සඳහා වැයවූ තථ්‍ය මුදල කොපමණද;

(iii) උක්ත මුදල් ප්‍රමාණයන් තථ්‍ය ලෙසින් වැයකරන ලද්දේ කිනම් වැය ශීර්ෂයන් යටතේද;

(iv) උසස් අධ්‍යාපනය සඳහා මාසිකව වැය කරන ලද මුදල් ප්‍රමාණය හා එම මුදල් පැවරූ ශීර්ෂයන් කවරේද;

(v) අයවැයෙන් උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් පවරනු ලැබූ අයවැය ශීර්ෂයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3083/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යෑමට සමානුපාතිකව මිල ඉහළ ගොස් ඇති දුම්වැටි (සිගරට්) වර්ගවල නම් කවරේද;

(ii) එලෙස මිල ඉහළ ගොස් නොමැති සිගරට් වර්ග තිබේ නම්, ඒවා කවරේද;

(iii) 2012 මාර්තු මාසයේදී ඩන්හිල් වර්ගයේ දුම්වැටියක මිල ඉහළ ගිය ප්‍රමාණය කොපමණද;

(iv) එහි ප්‍රතිඵලයක් ලෙස එක් දුම්වැටියක් විකිණීමෙන් රජයට සහ දුම්කොළ සමාගමට ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවල දී ශ්‍රී ලංකාවේ අලෙවිකළ මුළු සිගරට් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත අගයන්ට අනුව සිගරට් අලෙවියේ වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3379/'12

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් අනුමත කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල් අතරින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාත් සභාව මගින් 2012 වර්ෂය සඳහා එම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදලින් රෝහල්වල සිදුකළ සේවාවන් කවරේද;

(iii) 2012 වර්ෂයේදී උතුරු මැද පළාතේ එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) සමස්තයක් වශයෙන් එම වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගත් එක් රෝගියෙක් සඳහා උතුරු මැද පළාත් සභාවෙන් වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3630/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සබරගමුව විශ්වවිද්‍යාලයේ,

(i) කළමනාකරණ පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

(ii) එම පීඨයේ සිටින මහාචාර්යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) භූ විඥාපන පීඨයේ ආචාර්යවරුන්ගේ සහ අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතීද;

(iv) සමාජ විද්‍යා හා භාෂා පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4092/'13

ගරු අනුර දිසානායක මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ඒ යටතේ පුහුණු වන සිසුන් වෙනුවෙන් 2013 වර්ෂයේදී කොළඹ දී පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩමුළු පවත්වන ලද දිනයන් හා එක් එක් වැඩමුළුව සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව කවරේද;

(iii) එම වැඩමුළුවල පරමාර්ථ කවරේද;

(iv) එම වැඩමුළුවලට සහභාගී වූ දේශකයින් කවුරුන්ද:

(v) එම එක් එක් වැඩමුළුව වෙනුවෙන් ප්‍රවාහන, ආහාර, දේශන ගාස්තු ඇතුලුව සිදුකළ සමස්ත වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4220/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විනිශ්චයකරුවන්ගේ ආයතනයේ පූර්ණකාලීනව සේවයේ යෙදෙන සංඛ්‍යාව කොපමණද;

(ii) 2010, 2011 සහ 2012 යන එක් එක් වර්ෂයේ දී එම ආයතනය විසින් වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව තුළ විනිශ්චයකරුවන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා රජය විසින් ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්දියාව, මලයාසියාව වැනි රටවල පවතින ආකාරයේ විශ්වවිද්‍යාල මට්ටමේ විනිශ්චයකරුවන් පුහුණු කිරීමේ ආයතනයක් ආරම්භ කිරීමට ගරු අතාවුද සෙනෙවිරත්න අමාත්‍යවරයා අධිකරණ අමාත්‍යධූරය දරන කාලයේ තීරණයක් ගෙන තිබූ බව දන්නේද;

(ii) විශ්වවිද්‍යාල මට්ටමේ විනිශ්චයකරුවන් පුහුණු කිරීමේ ආයතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම සඳහා වන අදහස පිළිබඳව එකඟ වන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3114/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් පුත්තලම දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන් හෝ අන්සතු කළ පුත්තලම දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබාදීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත්වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබාගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳ චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3381/’12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන අලි ප්‍රහාර නිසා මියයන පුද්ගලයන් වෙනුවෙන් වන්දි ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(ii) එම වන්දි ලබා දීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) වන්දි ගෙවීමේදී එක් පුද්ගලයෙකුට ලබා දෙන මුදල කොපමණද;

(iv) එම මුදල ප්‍රමාණවත් වන්නේද;

(v) එකී මුදල වැඩි කිරීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, වැඩි කරනු ලබන මුදල සහ වැඩි කිරීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වන අලින්ගෙන් සිදු වන වගා හානි සඳහා වන්දි ගෙවන්නේද;

(ii) එසේ ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) වගා හානි වන්දි මුදල තීරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) වන අලි පහරදීම සහ වගා හානි හේතුවෙන් ගොවීන්ට සිදු වන අලාභ ආවරණය කරන රක්ෂණ ක්‍රමයක් ඇතිකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වෙඩිතැබීම්, විදුලිසැර වැද්දවීම් හෝ වෙනත් ක්‍රම මගින් වන අලියකු ඝාතනය කරන තැනැත්තෙකුට දඩ මුදලක් නියම කිරීමට හෝ වෙනත් දඬුවමක් ලබා දීමට හැකි නීති පවතින්නේද;

(ii) එසේ නම්, එම නීති යටතේ නියම කළ හැකි දඩ මුදල කොපමණද;

(iii) එම දඩ මුදල නොගෙවන අයෙකු සිරගත කළ හැකි කාල සීමාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3395/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මගින් සමෘද්ධි නිලධාරීන්ගේ හා කළමණාකරුවන්ගේ සමාජ ආරක්ෂණ කටයුතු සඳහා පවත්වා ගෙන යනු ලබන අරමුදලට එම නිලධාරීන්ගේ මාසික වැටුපෙන් රුපියල් 50.00ක මුදලක් අඩුකර ගන්නා බවත්;

(ii) වර්ෂ දෙකක පමණ කාලයක සිට එම අරමුදල මගින් සමෘද්ධි සමාජ ආරක්ෂණ හිමිකම් වන්දි මුදල් ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදල පවත්වාගෙන යනු ලබන ගිණුමේ මේ වන විට ඇති මුළු මුදල කොපමණද;

(ii) 2012 ජුනි 30 දිනට පසුව එම අරමුදලින් හිමිකම් වන්දි මුදල් ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) මෙතෙක් ලබා නොදෙන ලද හිමිකම් මුදල් ලබාදීමට කඩිනමින් කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3908/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල නගරයට යාබද දඬුගම ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ව ගාල් සංඛ්‍යාව සහ සත්ව ඝාතකාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රදේශයේ නිරන්තරව එකතු වන ජීව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙළ කවරේද;

(iii) එම අපද්‍රව්‍යවලට අදාළව යම් පාරිසරික හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4093/'13

ගරු අනුර දිසානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අර්ධ සුඛෝපභෝගී මගී ප්‍රවාහන සේවාව සඳහා ගාස්තු ගණනය කර ඇති පදනම කවරේද;

(ii) අර්ධ සුඛෝපභෝගී මගී ප්‍රවාහන සේවය සඳහා ලබා දී ඇති ප්‍රමිතීන් කවරේද;

(iii) එම ප්‍රමිතීන්ට අනුකූල නොවන බස් රථ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iv) පසුගිය අවුරුදු 3 ක කාලය ඇතුළත එවැනි ක්‍රියා මාර්ග ගනු ලැබූ බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අර්ධ සුඛෝපභෝගී බස් රථවලට සමාන වෙනත් බස් රථ සාමාන්‍ය ගාස්තු යටතේ ධාවනයේ යෙදෙන බව දන්නේද;

(ii) අර්ධ සුඛෝපභෝගී බස් රථ හරහා මගී ජනතාවගෙන් අමතර මුදලක් අයකිරීම සිදුවන්නේද;

(iii) අර්ධ සුඛෝපභෝගී බස් රථ සේවාව නතරකර දැමීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා කරන ලද ප්‍රකාශයට සමගාමීව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඒවායේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3131/'12

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ ජනවාරි 01 වැනිදා සිට, වෙන් කොට ඇති, අන්සතු කොට ඇති හෝ බලහත්කාරයෙන් බාර දී ඇති සියලුම ඉඩම් කවරේද;

(ii) ජනතාවට වන්දි ගෙවමින් එම ඉඩම් අත්පත් කර ගැනීමට හෝ පවරා ගැනීමට හේතුව කවරේද;

යන්න යාපනය දිස්ත්‍රික්කයට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී දිස්ත්‍රික්කයෙහි රජය මගින් ජනපද පිහිටුවීම සිදුවෙමින් පවතින්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මාර්තු මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3132/'12

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන්, අන්සතු කළ මඩකලපුව දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කවරේද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබා දීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත්වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳව චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3398/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර මහ නගර සභාව මගින් තම බල ප්‍රදේශය අලංකාර කිරීම සඳහා කටයුතු කරමින් සිටියද නගරයේ ප්‍රධාන පෙළේ රජයේ පාසල් හා රාජ්‍ය ආයතන පිහිටි ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල පිහිටි අතුරු මාර්ග වසර 20 කින් පමණ ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) අතුරු මාර්ග දෙපස තැනින් තැන කැළි කසළ දැමීම මහජනතාවගේ සෞඛ්‍යයට තර්ජනයක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාතර මහ නගර සීමාව තුළ අබලන් මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) කැළි කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3607/'13

ගරු පී. හැරිසන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 දෙසැම්බර් සහ 2013 ජනවාරි කාල සීමාවේ දී හටගත් ගංවතුර හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ;

(i) විපතට පත් පවුල් සංඛ්‍යාව;

(ii) පූර්ණ හා අර්ධ හානියට පත්වීම නිසා වන්දි ගෙවූ නිවාස සංඛ්‍යාව;

(iii) වන්දි නොගෙවූ පූර්ණ හා අර්ධ හානියට පත් වූ නිවාස සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගංවතුර තත්ත්වයන් හේතුවෙන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හානියට පත් වගාවන් කවරේද;

(ii) එම වගාබිම්වල වපසරිය කොපමණද;

(iii) පූර්ණ හානියට හා අර්ධ හානියට පත් කුඹුරු අක්කර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පූර්ණ හානියට පත් අනෙකුත් බෝග වගාබිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(v) පූර්ණ හානි සිදුවූ සහ අර්ධ හානි සිදුවූ කුඹුරු අක්කරයක් වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) පූර්ණ හා අර්ධ හානි සිදුවූ අනෙකුත් අතිරේක බෝග වගා වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(vii) එසේ නම්, ලබා දී ඇති වන්දි මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) ඉහත සඳහන් පරිදි වන්දි ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4094/'13

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළ දී සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම විසින් කවර හෝ වර්ගයක ගුවන්යානා මිල දී ගෙන හෝ බදු පදනම මත ලබා ගෙන තිබේද;

(ii) එම ගුවන්යානා මිල දී ගැනීම් හෝ බදු ගැනීම් සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iii) මිල දී ගැනීම් හෝ බදු පදනම මත ලබාගැනීම් සිදුකරනු ලැබුයේ ටෙන්ඩර් කැඳවීමකින් නම්, ඒ සඳහා ඉල්ලුම් කළ ආයතන හා මිල ගණන් කවරේද;

(iv) ඉල්ලුම් කළ ආයතන අතරින් තෝරා ගනු ලැබූ ආයතන කවරේද;

(v) එම ආයතන තෝරා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුවන්යානා මිල දී ගැනීම හෝ බදු පදනම මත ලබා ගැනීම වෙනුවෙන් වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) එම මුදල් ණය මගින් සපයා ගනු ලැබුවේ නම්, එම ණය ප්‍රමාණයන්, පොලී අනුපාතයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාලය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4102/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "නැව්වලින් පිටකරන තෙල්" ගබඩා කිරීමට හා ප්‍රවාහනය සඳහා අවසර දෙමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති වාර්ෂික බලපත්‍රයක් යොදා ගෙන සිදුකරනු ලැබූ "දැව්තෙල්" ගබඩා කිරීමේ ජාවාරමක් මුල්ලේරියාව හා දෙකටන මෝරගල ප්‍රදේශයේ දී පොලීසිය විසින් අනාවරණය කරගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම වැටලීම්වලට අනුව,

(i) එම දැව්තෙල් ප්‍රවාහනය කර ඇති ස්ථානය කවරේද;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එම සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එහිදී අත්අඩංගුවට ගත් පිරිසට ලබා දුන් දඬුවම කවරේද;

(iv) ප්‍රවාහනය කර ඇති දැව්තෙල් ප්‍රමාණය කොපමණද;

(v) ගබඩා කොට තිබූ දැව්තෙල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3133/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් අම්පාර දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන් හෝ අත්සතු කළ අම්පාර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබාදීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත් වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳ චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3419/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පසුගිය වර්ෂ 10ක කාලසීමාව තුළ ලියාපදිංචි වී ඇති ත්‍රිරෝද රථ හා යතුරුපැදි සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ත්‍රිරෝද රථ සහ යතුරුපැදි සඳහා රජය ලබා දී ඇති සහන කවරේද;

(iii) ත්‍රිරෝද රථ සහ යතුරුපැදි ආශ්‍රිත කර්මාන්තවල යෙදෙන අය දිරිමත් කිරීම සඳහා එම රථවල අමතර කොටස් සඳහා බදු සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) දැනටමත් එලෙස සහන ලබාදී ඇත්නම්, ඒවායේ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3608/'13

ගරු පී. හැරිසන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 දෙසැම්බර් සහ 2013 ජනවාරි කාල සීමාවේ දී හටගත් ගංවතුර හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ;

(i) විපතට පත් පවුල් සංඛ්‍යාව;

(ii) පූර්ණ හා අර්ධ හානියට පත්වීම නිසා වන්දි ගෙවූ නිවාස සංඛ්‍යාව;

(iii) වන්දි නොගෙවූ පූර්ණ හා අර්ධ හානියට පත් වූ නිවාස සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගංවතුර තත්ත්වයන් හේතුවෙන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හානියට පත් වගාවන් කවරේද;

(ii) එම වගාබිම්වල වපසරිය කොපමණද;

(iii) පූර්ණ හානියට හා අර්ධ හානියට පත් කුඹුරු අක්කර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පූර්ණ හානියට පත් අනෙකුත් බෝග වගාබිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(v) පූර්ණ හානි සිදුවූ සහ අර්ධ හානි සිදුවූ කුඹුරු අක්කරයක් වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) පූර්ණ හා අර්ධ හානි සිදුවූ අනෙකුත් අතිරේක බෝග වගා වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(vii) එසේ නම්, ලබා දී ඇති වන්දි මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) ඉහත සඳහන් පරිදි වන්දි ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4103/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා අවස්ථා ගණනාවක දී මෙරටට ආනයනය කර ඇති S - 11 (S11) වර්ගයේ බලවේග කට්ටල සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලවේග කට්ටලවලින් මේ වන විට ධාවනයේ පවතින සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලවේග කට්ටල සඳහා ලබා දී ඇති වගකීමේ කාල සීමාව කවරේද;

(iv) එම බලවේග කට්ටල ආනයනය කිරීම වෙනුවෙන් වැය වූ මුදල කොපමණද;

(v) ඉහත සඳහන් බලවේග කට්ටලවලින් දැනට විවිධ දෝෂ මත ධාවනයෙන් ඉවත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?

4149/'13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම - තම්මැන්නාව මැණික් ඉඩම් වෙන්දේසි භූමියේ CCTV කැමරා පද්ධතියක් සවි කරනු ලැබුවේද;

(ii) CCTV කැමරා සවිකර තිබූ කාල සීමාව කවරේද;

(iii) එම CCTV කැමරා මිලට ගනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, එම කැමරා ලබා ගත්තේ බදු පදනම මතද;

(v) බදු පදනම මත ගත්තේ නම්, එම CCTV කැමරා ලබා දුන් ආයතනය කවරේද;

(vi) එම කැමරා පද්ධතිය මිල දී ගැනීම හෝ බදු ගැනීම සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රියා පටිපාටිය කවරේද;

(vii) CCTV කැමරා පද්ධතියක් සවි කර තිබියදී 2012.04.03 දින හෝ ආසන්න දිනකදී තම්මැන්නා භූමියේ ඉල්ලම් පස් රහසිගතව ප්‍රවාහනය කර තිබේද;

(viii) එසේ නම්, එම ඉල්ලම් පස් ප්‍රවාහනය කිරීම CCTV කැමරා පද්ධතියේ පටිගත වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3134/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන් හෝ අන්සතු කළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබාදීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත් වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳ චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3524/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොග්ගල ගුවන් හමුදා කඳවුර අසල රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් නිවාස සංකීර්ණයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එම නිවාස සංකීර්ණයේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයනු ලැබූ මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට ඉහත නිවාස සංකීර්ණයෙන් පදිංචිය සඳහා ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මෙතෙක් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දී නොමැති නම්, එය ජාතික ධනය විනාශ කිරීමක් බව පිළිගන්නේද;

(iii) එසේ නම්, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා හෝ වෙනත් ඵලදායි කටයුත්තකට එම නිවාස ව්‍යාපෘතිය යොදා ගැනීමට සැලසුම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මාර්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3146/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 ජනවාරි මස 01 වැනිදා සිට අද දක්වා ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු ආධාර, සහනදායී ණය සහ ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මුදල් ලබා දී තිබූ වර්ෂයක් සඳහා සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය කවරේද;

(iii) එක් එක් මුදල් ලබා දීම සඳහා ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) එකී මුදල් උපයෝගී කර ගනු ලැබූ එක් එක් ව්‍යාපෘතියෙන් උපයා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කවරේද;

(v) ණය මුදල ලබා දී තිබූ දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණය මුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3293/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට සිදුවන හිරිහැර පිළිබඳව සොයා බැලීම සඳහා 2008 ජුනි මාසයේදී යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ කාමර අංක 2/08 හිදී ඇමති අනුකමිටුවක් පිහිටුවනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම අනුකමිටුව අහෝසි කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ඇමති අනුකමිටුවේ කටයුතු පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ කුලිය, දුරකථන බිල්පත් සහ විදුලි බිල්පත් සඳහා වැය කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වියදම්වලට අමතරව දරන ලද වෙනත් වියදම් සඳහා වැය වූ මුළු මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම වියදම් සිදුකරන ලද අමාත්‍යාංශ සහ ඊට අදාළ වැය ශීර්ෂයන් කවරේද;

(ii) ඉහත සඳහන් ගෙවීම් මෙතෙක් සිදුකර නොමැති නම්, එම ගෙවීම් සිදුකරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3609/'13

ගරු පී. හැරිසන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 දෙසැම්බර් සහ 2013 ජනවාරි කාල සීමාවේදී හටගත් ගංවතුර හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

(i) විපතට පත් පවුල් සංඛ්‍යාව;

(ii) පූර්ණ හා අර්ධ හානියට පත්වීම නිසා වන්දි ගෙවූ නිවාස සංඛ්‍යාව;

(iii) වන්දි නොගෙවූ පූර්ණ හා අර්ධ හානියට පත් වූ නිවාස සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගංවතුර තත්ත්වයන් හේතුවෙන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හානියට පත් වගාවන් කවරේද;

(ii) එම වගාබිම්වල වපසරිය කොපමණද;

(iii) පූර්ණ හානියට පත්වූ හා අර්ධ හානියට පත් කුඹුරු අක්කර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පූර්ණ හානියට පත් අනෙකුත් බෝග වර්ග වගාබිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(v) පූර්ණ හානි සිදුවූ සහ අර්ධ හානි සිදුවූ කුඹුරු අක්කරයක් වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) පූර්ණ හා අර්ධ හානි සිදුවූ අනෙකුත් අතිරේක බෝග වගා වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(vii) එසේ නම්, ලබා දී ඇති වන්දි මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) ඉහත සඳහන් පරිදි වන්දි ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4105/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ මැතිවරණ කොට්ඨාසයට අයත් "කුමාරතැන්න" ගම්මානයේ;

(i) ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රවේශ මාර්ගය පිළිසකර කිරීම වෙනුවෙන් "අන්තර් ගම්මාන" වැඩ සටහන යටතේ මුදල් වෙන්කර තිබේද;

(iii) ඉහත මාර්ගය සඳහා මුදල් වෙන් කර තිබේනම්, එම මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම මාර්ගයේ වැඩ නිම කිරීමට නියමිත දිනය කවරේද;

(v) පාසලේ ගුරුවරුන් සංඛ්‍යාව සහ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ගම්වාසීන්ට වෛද්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා රෝහලක් පිහිටා ඇති ප්‍රදේශය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?

4153/'13

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ දී පාසල් නිල ඇඳුම් සඳහා චීනයෙන් ආනයනය කරනු ලැබූ රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම රෙදි ආනයනය කරනු ලැබූ සමාගම කවරේද;

(iv) එම සමාගම හරහා ඉහත නිල ඇඳුම් රෙදි ආනයනය කිරීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා නිල ඇඳුම් සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන් කවරේද;

(ii) ඉහත සමාගම් අතුරින් තෝරා ගනු ලැබුවේ අඩුම ලංසුව ඉදිරිපත් කරන ලද සමාගමද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) අඩුම ලංසුව ඉදිරිපත් කළ සමාගම විසින් ඉදිරිපත් කළ රෙදිවල තිබූ අඩුපාඩු කවරේද;

(v) තෝරාගත් සමාගම ඉදිරිපත් කළ නිල ඇඳුම් රෙදිවලද ඉහත අඩුපාඩු මෙන්ම තවත් අඩුපාඩුද තිබූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3148/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009, 2010, 2011, 2012 සහ 2013 යන වර්ෂවලදී ලබාගෙන ඇති ශුද්ධ ණය ප්‍රමාණයන් කවරේද;

(ii) ශුද්ධ සංචිත විශාල වශයෙන් වැඩිවෙමින් පවතින බවට රජය විසින් සිදු කරනු ලබන ප්‍රකාශයට අනුව ඉහත කී වර්ෂ තුළදී සංචිත වැඩි වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා සංචිතවලට ඇතුළත් කරන ලද දිගු කාලීන ණය ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුන තුළ එක් එක් වර්ෂයේදී ආනයනයේ ප්‍රතිශතයක් වශයෙන් සංචිත ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සංචිතවල තත්ත්වය ප්‍රකාශ කරනු ලබන තරමට ධනාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3529/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩ කරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩ කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩ කිරීම්වලට අදාලව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩ කිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩ කිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩ කිරීමට අවස්ථාව ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3610/'13

ගරු පී. හැරිසන් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරදන්කඩවල සිට පහළ අඹතලේ හරහා මුරියාකඩවල මාර්ගයේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) එම මාර්ගයේ දුර හා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මාර්ගයේ අලුත්වැඩියා කටයුතු කරනු ලබන කොන්ත්‍රාත් සමාගමේ නම හා එහි හිමිකරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ වැඩ අවසන් කළ යුතුව තිබූ ගිවිසුම්ගත දිනය කවරේද;

(ii) එම කාල සීමාව තුළ දී ඉහත මාර්ගයේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වූයේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත සඳහන් කොන්ත්‍රාත් සමාගම අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ වෙනත් මාර්ග ඉදිකිරීම් කටයුතු භාරගෙන තිබේද;

(iv) එසේ නම්, එම එක් එක් මාර්ගයේ නම සහ ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම මාර්ග ඉදිකිරීම් අවසන් කිරීමේදී ද ඉහත පරිදි නියමිත කාල සීමාව ඉක්මවා කල්ගත කොට තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කොන්ත්‍රාත් සමාගමට මාර්ග සංවර්ධන ඉදිකිරීම් කටයුතු හරියාකාරව කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි කොන්ත්‍රාත් සමාගමක් සම්බන්ධයෙන් ඉදිරියේ දී ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4106/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජය මගින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව යටතේ ඉදිරිපත් කර ඇති "ජාතික භෞතික සැලැස්ම" පිළිබඳ දැනුවත් වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සැලැස්මට අනුව,

(i) භාවිතයට ගැනීමට නියමිත වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

(ii) වනාන්තර මැදින් මහා මාර්ග ඉදිකිරීමට නියමිත ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(iii) වනාන්තර මැද සංචාරක කළාප ඉදිවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද ?

4154/'13

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 නොවැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමතිය යටතේ 2012 වර්ෂයේ බෙදාහැරීම සඳහා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් මිල දී ගැනීමට අනුමතිය ලැබුණු පාසල් නිල ඇඳුම් රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) 2012 වර්ෂයේ පාසල් නිල ඇඳුම් සඳහා එම ආයතනය විසින් මිල දී ගනු ලැබූ රෙදි ප්‍රමාණය කොපමණද;

(iii) අමාත්‍ය මණ්ඩල අනුමතිය ඉක්මවා අතිරික්ත නිල ඇඳුම් රෙදි ප්‍රමාණයක් මිල දී ගනු ලැබීමට හේතු කවරේද;

(iv) එම මිල දී ගැනීම නිසා රජයට සිදු වූ පාඩුව කොපමණද;

(v) ඒ සඳහා වගකිව යුතු අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මාර්තු මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3149/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ලබාගත් ණය මුදල් හා ඒවායේ ආපසු ගෙවීමේ කාල සීමාවන් වාර්ෂික පදනමින් කවරේද;

(ii) ආදායම් උත්පාදනය කර ණය ආපසු ගෙවන ආකාරය ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

(iii) පැරණි ණය ගෙවීම සඳහා රජය තව තවත් ණය ගැනීම සිදු කරන්නේද;

(iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබා ගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද;

(v) රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේ සිට මේ දක්වා රජය ණය, රජයේ බැඳුම්කර යනාදිය හරහා ඇ.එ.ජ ඩොලර් මිලියන 500 ඉක්මවා ණයට ගෙන ඇති අවස්ථා ද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3530/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වැව්ලි මානව සංවර්ධන භාරයට මිල දී ගෙන ඇති වාහන සංඛ්‍යාව එක් එක් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වාහන මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් හා ඉදිරිපත් කළ ටෙන්ඩර් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම භාරය සඳහා මිල දී ගන්නා ලද වාහන භාවිතා කරනු ලබන කාර්යයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වැලිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල් රංජිත් ඇල්ලෙගල මහතා ගේ පරිහරණය සඳහා අලුතින් මිල දී ගත් පැට්‍රල් හයිහුන්ඩායි රථයේ වටිනාකම කොපමණද;

(ii) එම රථය පාවිච්චියට නොගෙන ගරාජයේ ගාල් කර තබා ඇත්තේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3611/'13

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ ඇති,

(i) පළාත් සභා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව කොපමණද;

(ii) එම පාසල් අතුරින් අධ්‍යාපන කොට්ඨාස පදනමින් ඇති ප්‍රාථමික සහ ද්විතීය පාසල් සංඛ්‍යාව කොමණද;

(iii) එම පාසල්වලට අවශ්‍ය මූලික පහසුකම් ප්‍රමාණවත්ව සපයා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂය සඳහා උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කළ මුදල;

(ii) 2013 වර්ෂයේ දී එම පළාතේ පාසල්වලට ලබා දීම සඳහා මුද්‍රණය කළ ගුරු අත්පොත්, වාර සටහන් පොත් සහ කැලැන්ඩර සංඛ්‍යාව;

(iii) මුද්‍රණය කළ කැලැන්ඩරයක හා වාර සටහන් පොතක මිල;

(iv) ගුරු අත්පොතක් සඳහා වෙන් කළ මුදල;

(v) ඉහත සියලු ලේඛනවල මුද්‍රණ කටයුතු සඳහා වැය කළ මුළු මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත මුද්‍රණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(ii) එසේ නම්, ඊට ඉදිරිපත් වූ ආයතන කවරේද;

(iii) එම මුද්‍රණ කටයුතු සිදු කළ මුද්‍රණාලයේ නම කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) උක්ත පළාත් අධ්‍යාපන ඇමතිවරයාගේ ඡායාරූපය සෑම පළාත් සභා පාසලකම ප්‍රදර්ශනය කිරීමට තීරණය කර තිබේද;

(ii) එතුමාගේ ඡායාරූපය මුද්‍රණයට හා රාමු කිරීමට පළාත් සභා මුදලින් රුපියල් ලක්ෂ 15ක් වැයකළ බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4107/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම යටතේ පත්වීම් ලැබූ උපාධිධාරීන්ගේ වැටුප් කාණ්ඩයන් සැකසී ඇති ආකාරය කවරේද;

(ii) තනතුරු නාම 260 මත රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ගේ උසස්වීම් පටිපාටිය පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා දෙන්නේද;

(iii) අලුතින් බඳවා ගත් උපාධිධාරීන්ට ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයට ඉල්ලුම් කිරීමේ අවස්ථාව ලබා දෙන්නේද;

(iv) උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී සලකා බලනු ලබන උපරිම වයස් සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3150/'12

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 ජනවාරි 1 වැනි දින සිට අද දක්වා ශ්‍රී ලංකාවට චීනයෙන් ලැබී ඇති ආධාර, සහනදායී ණය හා ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී අරමුදල් ලබා දුන්, සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය වසරක් සඳහා කොපමණද;

(iii) එක් එක් අරමුදල් සැපයුමේ ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) අරමුදල් යොදාගත් එක් එක් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් කවරේද;

(v) ණය ලබා දුන් දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3531/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ දී උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේ වැඩසටහන යටතේ රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන් අතුරින් මේ වන විට සේවය ස්ථිර කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සේවය ස්ථිර කිරීම සඳහා ඉතිරිව සිටින සංඛ්‍යාව කොපමණද;

(iv) එම රැකියාලාභී උපාධිධාරීන්ගේ සේවය ස්ථිර කරන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3825/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සියලුම ඖෂධ වෙළඳ සැල් වායුසමනය කර තිබේද;

(ii) නොඑසේ නම්, මේ වන විටත් වායුසමනය නොකරන ලද එම වෙළඳ සැල් පවත්වාගෙන යෑමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සියලුම රෝහල්වල පවතින ඖෂධ ගබඩා වායුසමනය කර තිබේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iii) සියලුම ඖෂධ වර්ග වායුසමනය කළ ස්ථානවල ගබඩා කිරීම අත්‍යාවශ්‍යවේද;

(iv) නොඑසේ නම්, ගබඩා කිරීමේ දී වායුසමනය කිරීමක් අත්‍යවශ්‍ය නොවන ඖෂධ වර්ග කවරේද;

(v) එවැනි ඖෂධවල කල් ඉකුත්වීම් කාල සීමාවක් නොපවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4108/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් දේශීයව නිපදවන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) විදේශ රටවලින් මෙරටට ගෙන්වන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඖෂධ හා ශල්‍ය උපකරණ ගෙන්වීම සඳහා 2013 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය මගින් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දේශීය වශයෙන් ඖෂධ මිල දී ගැනීම් සඳහා 2013 අයවැය මගින් වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම මුදලින් වැය කළ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එක් එක් ඖෂධ සමාගමෙන් මිලට ගත් ඖෂධ තොගවල වටිනාකම කොපමණද;

(ii) මේ වන විට එම මිල දී ගැනීම්වලට අදාළව ණය මුදල් ගෙවීමට තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් සමාගමට ගෙවීමට ඇති ණය මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ කාර්යභාරය කවරේද;

(ii) කොළඹ කොටස් හුවමාරුවේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ හිටපු සභාපතිවරුන් වන ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය සහ තිලක් කරුණාරත්න මහතා විසින් හෙළි කරන ලද, 2011 සහ 2012 වර්ෂවලදී කොටස් වෙළඳ පොළ මෙහෙයුම්වලට අදාළව සිදු වූ බවට වාර්තා වූ "මාෆියා" ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශන සිදු කර තිබේද;

(ii) එම විමර්ශනවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

(iv) ක්‍රියාමාර්ග ගෙන සමථයකට පත් කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම බේරුම් කිරීම්වල පිරිවැය කවරේද;

(vi) එම බේරුම් කිරීම් දේශපාලන බලපෑම් මත සිදු වූ ඒවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?